ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලයට අනුබද්ධිත ශ්‍රී ලංකා සංස්කෘතික අධ්‍යාපන කේන්ද්‍රය, ඩුබායි.
Sri Lanka Cultural Education Centre attached to the Consulate General of Sri Lanka, Dubai
බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි අංක E/A.D./ද.ප./ලි/001

2017 ජනවාරි 18 යොමු අංකය 1617-026-R1

දයාබර දෙමාපියන් වෙත,

**<u>විශේෂ රැස්වීම - තාවකාලිකව නවත්වන ලද දහම් පාසැල් අධ්‍යයන කටයුතු නැවත ආරම්භ කිරීම</u>**

2017 ජනවාරි 13 වැනිදා පැවැත්වූ විශේෂ රැස්වීමට නොයෙකුත් හේතූන් මත සහභාගී වීමට නොහැකි වූ දෙමාපියන්ගේ ඉල්ලීම් සලකා බලා එම දෙමාපියන්ගේ දරුවන් හටද දහම් පාසලේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට අවස්ථාව සැලසීමට දහම් පාසලේ කමිටුව සහ දෙමාපිය කමිටුව පහත සඳහන් පරිදි කටයුතු සූදානම් කරනු ඇත.

- දහම් පාසල නැවත ආරම්භයේ සිට අනිවාර්යයෙන් ක්‍රියාත්මක කලයුතු වැඩ පිළිවෙල සම්බන්ධයෙන් සහ දෙමාපියන් විසින් අනිවාර්යයෙන් පිළිපැදිය යුතු නව කොන්දේසි මාලාව පිළිබඳව දැනුවත් කිරීම සඳහා විශේෂ රැස්වීමක් 2017 ජනවාරි මස 27 වැනිදා සිකුරාදා පෙ ව 8.30ට උදෑසන බුද්ධ වන්දනාව අවසානයේදී දහම් පාසලේ පරිශ්‍රයේදී පැවැත්වෙනු ඇත.
- ඉහත රැස්වීමට (**ජනවාරි 13 දා** ) සහභාගී වීමට නොහැකි වූ දෙමාපියන් ගේ දරුවන් නැවත දහම් පාසලට ඇතුලත් කිරීමට අවශ්‍ය නම් එම දෙමාපියන් මෙම රැස්වීමට සහභාගී වීමද එම දරුවන් නැවත ලියාපදිංචි කිරීමද අනිවාර්ය වනු ඇත.
- මේ සමග **<u>අමුණා ඇති කොන්දේසි සහිත පත්‍රිකාව</u>** හොඳින් කියවා, අත්සන් කර රැස්වීමට පැමිණෙන විට රැගෙන විත් සංවිධායක මණ්ඩලයට භාර දෙන්න.
- **<u>දරුවාගේ ශිෂ්‍ය වාර්තා පොතද</u>** මෙම රැස්වීමට පැමිණෙන විට රැගෙන එන්න.
- මෙදින ලියාපාදිංචි වන දැරුවන් හට නැවත ලියාපදිංචි වීමෙදී නිකුත් කරන විශේෂ හැඳුනුම් පත නිකුත් කරනු ඇත.
- එම දරුවන් **<u>පෙබරවාරි 3 සිකුරාදා</u>** සිට දහම් පාසලට ඇතුලත් කරගනු ඇත.
- මින් ඉදිරියට මෙම රැස්වීම නැවත පැවැත්වෙන්නේ නැති බවත් නැවත ලියාපදිංචි කිරීමක් සිදු නොවන බවත් දැනුම් දෙමු. නැවත ලියාපදිංචි නොවන දරුවන් 2017-2018 වසර සඳහා ලියාපදිංචි වීමෙන් මීළඟ අධ්‍යයන වසරේදී සිට නැවත දහම් පාසලට සහභාගී විය හැක.
- **මෙම රැස්වීමට සහබාගී වීමට දහම් පාසලට පැමිණෙන විට ඔබගේ වාහනය කොන්සල් කායීාලය අසල (මෙහි අමුණා ඇති සිතියම බලන්න) නතර නොකරන මෙන් අවධාරණය කර සිටිමු.**

**<u>2017 ජනවාරි මස 13 පැවැත්වූ රැස්වීමට සහභාගී වී එදින නැවත ලියාපදිංචි කිරීමේදී නිකුත් කරන ලද හැඳුනුම් පත් ලබාගත් දරුවන් පමණක් එම හැඳුනුම් පත සමග ජනවාරි 20 වැනි දා සිට දහම් පාසලට සහභාගී විය හැකි බව දැනුම් දෙමු</u>**

ස්තුතියි,
සංවිධායක මණ්ඩලය